


# අලියාන්ස්

# විශ්‍රාම සුව

## සුරක්ෂිත විශ්‍රාම දිවියක් සඳහා

අලියාන්ස් ලංකා (අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්) යනු, ජර්මනියේ මියුනික් හි ප්‍රධාන කාර්යාලය පැවැත්වෙන, රක්ෂණ හා වත්කම් කළමනාකරණය ආශ්‍රිතව ප්‍රමුඛතම මූල්‍ය සේවා සම්පාදකයකු වන අලියාන්ස් සමූහයෙහි පූර්ණ හිමිකාරීත්වය දරන උප සමාගම වේ.

147,000 ක කාර්ය මණ්ඩල ශක්තියෙන් සමන්විත අලියාන්ස්, ලොව පුරා රටවල් 70කට අධික සංඛ්‍යාවක තනි හා ආයතනික සේවාලාභීන් මිලියන 100කට පමණ සේවය සලසයි. 2020 වර්ෂයේ ලොව අංක 1 රක්ෂණ සන්නාමය ලෙස පිදුම්ලත් අලියාන්ස්, ජීවිත හා සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන ජාත්‍යන්තරයේ විශාලතම රක්ෂණ සමාගම් 5 අතුරින් එකකි.

## අලියාන්ස් විශ්‍රාම සුව

විශ්‍රාමය යනු ඔබේ සිහින සබැ කරගැනීමට ඇති සුවිශේෂීම කාලයයි. ඔව් ඔබේ ආදරණීයයන් සමග සතුටෙන් කල් ගෙවීමට, ඔබේ ළමා කාලය නැවත සිහිගන්වමින් මුණුබුරු,මිනිබිරියන් සමග ප්‍රීති වන්නට, විනෝද චාරිකා, විනෝදාංශ වල යෙදීම වැනි ඔබේ ජීවිත සිහිනයන් සැබෑ කරගන්න දැන් ඔබටත් පහසුවෙන්ම පුළුවන්. ඔබේ වෘත්තිය ජීවිත කාලය පුරාවම ඔබ ඔබේ අනාගතය ගැනත් විශ්‍රාමය ගැනත් සිතමින් ඉතිරි කිරීමට සිතන නමුත්, ඒ අරමුදල් නිසි ලෙස කළමනාකරණය කිරීම මගින් ජීවිත කාලය පුරා ආදායමක් ලබා ගැනීමට හැකිවේද යන අවිනිශ්චිතතාවයට බොහෝ දෙනා මුහුණ දෙයි. අලියානස් විශ්‍රාම සුව ඔබට අවශ්‍ය ඒ අඛණ්ඩ ආදායම ලබා දීමට සූදානම්.

විශ්‍රාමයෙන් පසු මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම ඔබට කෙතරම් වටිනවාද යන්න අප හොඳින් දන්නවා. ජීවිතයේ සැඳෑ සමයේදී ඔබේ ආදරණීයයන්ට බරක් නැතිව ජීවත් වීම ඔබේ ඉලක්කයකි. නමුත් නිසි සැලසුම් රහිතව බොහෝ දෙනා හට අත්දකින්න වන්නේ මෙම දුෂ්කර යථාර්ථයයි. සැබවින්ම ඔබේ විශ්‍රාමය පිළිබඳ සැලසුම් කිරීම ඇරඹීමට හොඳම දවස අදයි.

අපගේ විශ්‍රාම සුව සැලසුම සකසා ඇත්තේ, ඔබට අවශ්‍ය කාලයක් සඳහා අවශ්‍ය ආදායම අවශ්‍ය අකාරයකට, අඛණ්ඩව ඔබට සපයා දීමටයි. ඔබේ ඉතිරියට විශිෂ්ට ප්‍රතිලාභ සලසන අලියාන්ස් විශ්‍රාම සුව සැලසුම් සිතේ සැහැල්ලුවෙන් විශ්‍රාම දිවිය ගත කිරීමට අවශ්‍ය මූල්‍ය ස්ථාවරත්වය ඔබට සහතික කරයි.

## සැලසුමේ ගුණාංග

- විශ්‍රාම ප්‍රතිලාභ ඔබට අවශ්‍ය ලෙස ලබා ගැනීමේ හැකියාව.
  - එකවර මුදලක් ලෙස.
  - වසර 5,10,15ක කාල සීමාවක් සඳහා අඛණ්ඩ ආදායමක් ලෙස.
- විශ්‍රාම යෑමේ දිනය, වාරික ගෙවීමේ කාල සීමාව තෝරා ගැනීමේ හැකියාව මෙන්ම අමතර වාරික ගෙවීමෙන් ඔබේ අරමුදල් වර්ධනය කර ගැනීමේ හැකියාව.
- මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව මෙන්ම වාර්ෂිකව වාරික ගෙවීමේ පහසුකම්.

## සැලසුමෙන් හිමිවන ප්‍රතිලාභ

**• මරණයකදී**

වාරික ගෙවීමේ කාල සීමාව තුළ - රක්ෂිත මුදල හෝ ආයෝජන ගිණුමේ වටිනාකම යන දෙකෙන් වැඩි අගය.

කල් දැමීමේ කාලය (වාරික ගෙවීම් සම්පූර්ණවී විශ්‍රාම ගෙවීම් ඇරඹීම දක්වා කාලය) - ආයෝජන ගිණුමේ වටිනාකම.

විශ්‍රාම ගෙවීම් සිදුකෙරෙන කාල සීමාව තුළ - පොරොන්දුවූ පරිදි ප්‍රතිලාභීන් සඳහා විශ්‍රාම ගෙවීම් එලෙසම ගෙවනු ඇත.

**• විශ්‍රාමයේදී**

මාසික ආදායමක් ලෙස හෝ එකවර ලබාගත හැකි මුදලක්.

**• වාරික ගෙවීමේ කාල සීමාව තුළ**

අතිරේක ප්‍රතිලාභ

- අතිරේක ජීවිතාවරණ ප්‍රතිලාභය
- හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය
- පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය
- අර්ධ හා නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය
- අසාධ්‍ය රෝග ආවරණ ප්‍රතිලාභය
- රෝහල් හිමිකම් දීමනා ප්‍රතිලාභය
- පවුල් සැත්කම් හා රෝහල් වියදම් දීමනා ප්‍රතිලාභය
- වාරිකාවරණ ප්‍රතිලාභය
- පවුල් ආදායම් ප්‍රතිලාභය (මරණයකදී හෝ පූර්ණ හා නිත්‍ය අකර්මණ්‍යතාවයකදී)
- ආන්තික රෝගාවරණ ප්‍රතිලාභය
- අවමංගල වියදම් ප්‍රතිලාභය
- වාරික ආරෝහණ ප්‍රතිලාභය

## සුදුසුකම්

ඇතුලත්වීමේ අවම වයස : අවුරුදු 20 (ඊළඟ උපන් දිනයට)
ඇතුලත්වීමේ උපරිම වයස : අවුරුදු 55 (ඊළඟ උපන් දිනයට)

## විශ්‍රාම වයස

අවම විශ්‍රාම වයස : අවුරුදු 40 (නිශ්චිත)
උපරිම විශ්‍රාම වයස : අවුරුදු 70 (නිශ්චිත)

## රක්ෂිත මුදල

අවම : රු 50,000/-
උපරිම: වාර්ෂික වාරිකය × වාරික ගෙවීමේ කාලය හෝ රු 1,000,000/- යන්නෙන් අවම අගය

කල් පිරීමේ වයස උපරිම : අවුරුදු 75

| | |
|---|---|
| රක්ෂණ කාල සීමාව | වාරික ගෙවීමේ කාල සීමාව, කල් දැමීමේ කාල සීමාව සහ විශ්‍රාම ගෙවීම් කාල සිමාව ඇතුළු මුළු කාල පරාසය |
| අවම වාරික ගෙවීමේ කාල සීමාව | අවුරුදු 5 |
| අවම කල් දැමීමේ කාල සීමාව | අවුරුදු 5 |
| අවම විශ්‍රාම මුදල් ගෙවීමේ කාල සීමාව | අවුරුදු 5 (මාසික ආදායමක් ලබා ගැනීම් තෝරා ඇත්නම්) |
| උපරිම වාරික ගෙවීමේ කාල සීමාව | අවුරුදු 30 |
| උපරිම කල් දැමීමේ කාල සීමාව | අවුරුදු 30 |
| උපරිම විශ්‍රාම මුදල් ගෙවීමේ කාල සීමාව | අවුරුදු 15 |
| විශ්‍රාම මුදල් ගෙවීමේ මාදිලි | මාසික/ ත්‍රෛමාසික/ අර්ධ වාර්ෂික/ වාර්ෂික<br>(අවුරුදු 5, 10 හෝ 15 යන රක්ෂණ හිමියා තෝරාගත් කාල සීමාවන් සඳහා) |

Allianz

**අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්**

සමාගම් අංක : PB 3493
අංක - 675, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවත,
(බේස්ලයින් පාර) කොළඹ 09, ශ්‍රී ලංකාව
දුරකතන :+9411 2 317 988 / 9
වෙබ් අඩවිය : www.allianz.lk
විද්‍යුත් තැපැල : customerservicelife@allianz.lk

**සැලකිය යුතුයි**

මෙහි එන ප්‍රතිලාභ සහ ආවරණයන්, විශ්‍රාම සුව ඔප්පුව සම්බන්ධයෙන් වන සංක්ෂිප්තයක් පමණක් වන අතර සියළුම නියමයන්, කොන්දේසි සහ බැහැර කිරීම් අලියාන්ස් විශ්‍රාම සුව ඔප්පුව ප්‍රකාර වේ.